සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# තෙවන වාර පරීක්ෂණය 2020

11 ශ්‍රේණිය

# සිංහල සාහිත්‍ය රසාස්වාදය

කාලය පැය 03 යි.

| නම/ විභාග අංකයඃ |
|---|

- I කොටසෙහි 1, 2 ප්‍රශ්නවලටත්, II කොටසෙහි 3 වැනි ප්‍රශ්නයටත්, III කොටසෙහි 4, 5, 6, 7, ප්‍රශ්නවලින් තෝරාගත් ප්‍රශ්න දෙකකටත් පිළිතුරු සපයන්න.

## I කොටස

(1) (i) සිට (v) දක්වා කොටස් කියවා ඒවා ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ලියන්න.

(i) ''ඉදින් මම තද කොට කීම් නම් මොහුගේ ළය පැළී යන්නේ ය. එහෙයින් අස්වසා කියමි.''

(අ) ප්‍රකාශය කියන ලද්දේ කවුරුන් විසින් කා හටද?

(ආ) ප්‍රකාශයෙන් කියන ලද්දේ කුමක් ද?

(ii) ''මෙහෙම ගියොත් අපට හෙටවත් යන්න වෙන්නේ නැහැ. ටිකක් ඉක්මන් කරපන්.''

(අ) මෙම ප්‍රකාශය කරන ලද්දේ කවුරුන් විසින් ද?

(ආ) නිර්මාණයේ රචකයාගේ නම කුමක් ද?

(iii) මිනිස් හට සොඳුරු ගුණ සහ නුගුණ ඇත
නිදොස් කෙනෙකු <u>මෙදියත</u> උපදනේ නැත
වෙසෙස් සිනිඳු <u>මුවරඳ</u> <u>බර</u> සහස් පත
කොරොස් නළින් යුතුවෙයි කටු පෙළිනි යුත

(අ) ඉරි ඇඳි පදවල අර්ථ ලියන්න.

(ආ) ''නිදොස් කෙනෙකු මෙදියත උපදනේ නැත'' යන්නෙහි අර්ථය පැහැදිලි කරන්න.

(iv) ''මෙවක් පටන් මහණවන්ට දෙමවුපියන් අනුනොදත් දරුවන් මහණ නො කරන්ට විධානයක් ඇත මැනවැ''

(අ) මෙම ප්‍රකාශය කළේ කවුරුන් විසින් කා හට ද?

(ආ) ප්‍රකාශය කරන්නට හේතුව කුමක් ද?

(v) ''ළමයෙක්ගෙ වැරැද්දකට ගුරුවරයෙක් ගැහුවට කමක් නෑ. ගහන්ඩම ඕනෑ.''

(අ) ප්‍රකාශය කරන ලද්දේ කවුරුන් විසින් ද?

(ආ) මේ ප්‍රකාශයෙන් කියැවෙන සිදුවීම කුමක් ද? (ලකුණු $4 \times 5 = 20$)

02 පහත සඳහන් කවි පෙළ කියවා දී ඇති ප්‍රකාශ උපයෝගී කරගෙන රසාස්වාදයක් ලියන්න.

පෙරදිග ගොරහැඬි රකුසෝ
මගේ ධ්‍යානය ඇයි කඩන්නේ
නිදා ගන්න පොරොවගත්ත
කළු රෙදි පොට
මොකටද මේ
තිරුවලට ඉරා දමන්නේ

කුරුල්ලන්ට ගල් ගහලා
උන් හොඳටම බිය කරලා
මල් පොහොට්ටු තිගැස්සිලා
කඳුළු හෙලනවා

ඇස් දෙක මම අරින්නෙ නෑ
තුරුලු කරන් භාවනාව
නැවතත් යන්නට යනවා
මම
මගේ දැහැන ලෝකයට ම

(1) කවි පෙළට පාදක වී ඇති අත්දැකීම කුමක් ද?
(2) කවි පෙළෙහි සාර්ථකත්වයට ඉවහල් වී ඇති කාව්‍යෝපක්‍රම
(3) පැදි පෙළෙහි ආකෘතිය හා භාෂාව
(4) කවි පෙළෙහි අපූර්වත්වය
(5) සම්ප්‍රදායට පිටින් කවියා උදෑසනෙහි දකින්නා වූ සිදුවීම් මොනවා ද? (ලකුණු 25 යි.)

## II කොටස

- පහත සඳහන් ගද්‍ය - පද්‍ය කොටස් දෙකෙන් **එක** කොටසකට පමණක් පිළිතුරු සපයන්න.

(3) නන්ද තෙරුන් වහන්සේ ද වහන්දෑගේ කතාවෙන් තරයේ ම ලජ්ජා ඇතිව දෙවඟනන් කෙරෙහි කළ ආලය හැරී, පෙරළී හන්ට තැබූ දෙයක් නොහෙන ලෙස තනා තබා ගන්නාසේ පෙරළා මහණ දමට ම සිත් සතන් යොමු කොටලා රජසිරි හැර අවුත් නිවන් සිරි නොවරදනා නිසා නොපමාව වසන සේක. යම් සේ ලේනෙක් තමා තරම් කෙනෙකුන් තමාට සතුරුව ආ කල තමාගේ නඟුට කුප්පවාලා එයින් ගසාලා පහ කෙරේද, එමෙන් ළං වූ කෙලෙස් සතුරු කෙනෙක් ඇත්නම් සතර සීවටන් නමැති මුගුරෙන් මරා පලවමින් යම් සේ දිවි දෙනක් කෙනෙක් වුවත් එක වරෙක වදන පැටවුන් මුත් දෙවන මුරයේ නො වද ද, එක මුරයෙන් ම වඳ වේ ද, එපරිද්දෙන් උපන් ජාති විනා භවෝත්පත්තු නැති වීමට අදහස් ඇතිව යම් සේ දිවියෙක් තණ කැළෑ ආදිය යට වැදලා හිඳ ගොදුරු අල්වා ගනී ද, එසේම අර්හත් ඵල නමැති ගොදුරු නිසා ගම්භීරාරණ්‍ය රුක් මුල්, ගල්පාවුළු, කඳුරැලි, ගල්ගුහා සොහොන අබවස යනාදියට එළඹ, යම් සේ දිවියා ගොදුරු අල්වා ගත් කලට වමැළයෙන් හුණු ගොදුරු නොකා ද එපරිද්දෙන් එක් විසි අන්වේෂණ වශයෙන් වේව යි' වාග් විඥප්ති වශයෙන් වේවයි, උපන් දෙයක් ඇත්නම් විෂ මිශ්‍රයක් පරිද්දෙන් හැර විදසුන් වඩා රහත් ඵල නමැති වොටුනු පැළඳීමෙන් හැර ආ රාජාභිෂේකයට රාජ්‍යාභිෂේකයක් ලදින් හැර පියා ආ ගෙමඟුල් කොට, හැර ආ විවා මඟුලට පලසමවත් විවා මඟුල් කොට බුදුන් සන්තක නිවන් රට තමන් වහන්සේටත් හිමි කළ සේක.

එක් දේවතාවෙක් රාත්‍රී වේලෙහි දෙව්රම වසන බුදුන් කරා ගොසින් වැඳලා ස්වාමිනී, මුඹ වහන්සේගේ මල් වූ නන්ද මහතෙරුන් වහන්සේ රහත් වූ සේකැ'යි කිවූය. ඔහු නො කියනතෙක් ම බුදුහුන් දෙව්ලොව ගිය ගමනින් ම සසර ගමන් නිමවා රහත් වූ නියාව විමස විමසා හිඳිනා සේක් එසේම දත් සේක. නන්ද මහ තෙරුන් වහන්සේ ද රාත්‍රිය පාන් වූ කල්හි බුදුන් කරා ගොසින් වැඳලා ''ස්වාමිනී, මුඹ වහන්සේ දෙව්ලොව වැඩි ගමනේ දෙවඟනන් පන් සියයක් මා ලබන නියාවට වූ ඇපයෙක් ඇත්තේ වේ ද, මෙවක් පටන් දෙවඟනන් තබා කිසිවකත් මාගේ ඇල්මක් නැති හෙයින් ඒ ඇප නැතැ'යි කි සේක.''

(i) ඡේදයේ කියවෙන ආකාරයට නන්ද තෙරුන් වහන්සේ දෙවඟනන් කෙරෙහි පැවති ආලය අත්හැර දැමීමට හේතු වූ කරුණ කුමක් ද? (ලකුණු 05)
(ii) බුදුරජාණන් වහන්සේ නන්ද රහත් වූ බව දැන ගත්තේ කෙසේද? (ලකුණු 05)
(iii) බුදුන් නන්ද කුමාරයාට වූ ඇපය කුමක් ද? (ලකුණු 05)
(iv) ඡේදයේ දක්වා ඇති ආකාරයට නන්ද තෙරුන් වහන්සේ රහත් බවට පත් වූ ආකාරය දැන්වීමට යොදාගෙන ඇති උපමා 4 ක් ලියා දක්වන්න. (ලකුණු 10)
(මුළු ලකුණු 25 යි.)

**නැතහොත්**

මඟක් නම්
පියවර මතින්
පියවර තබා
තැනූ මඟක් මයි
අතර මඟ ළත නොවී
මුව දොර සොයා යන
ගඟක්මයි

සිය දහස්
කෝ වේ හමුවන
මං සන්ධි පසුවන
අතවනා
දහසක් දෙනා
එක පියවරින්
දහසක් යොදුන් දුර
අරඹනා
මඟකට දොසක් නොකියන්
නැත ඊට තිසි කාරණා

අම්බලම්
විසිතුරු සල්පිලෙන්
වටරවුම්
පදිකා මල් වැටෙන්
සෙවණලු සදන
තුරුලිය පෙළින්
සැදි දෙපස මනරම් - සෝබනා

මොහොතක ඉසිඹු
ලබන විනා
නැත අතර මඟ
නතරවන වාසනා

මඟක් නම්
ඒ මඟක් ම යි
නොමඟක් නොවෙයි
මඟ නවතිනා

(i) පද්‍ය පන්තිය නිර්මාපකයා ගේ අපේක්ෂාව වූයේ කුමක් ද? (ලකුණු 05)

(ii) තම අත්දැකීම ඉදිරිපත් කිරීම සඳහා කවියා යොදා ගෙන ඇති ආකෘතිය පිළිබඳව පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iii) කවි පෙළෙහි සාර්ථකත්වයට ඉවහල් වී ඇති කාව්‍යෝපක්‍රම මොනවා ද? උදාහරණ ගනිමින් විමසන්න. (ලකුණු 05)

(iv) මෙම කවි පෙළෙන් ඉස්මතු කර දක්වන ජීවන දෘෂ්ටි පිළිබඳ විමසීමක් කරන්න. (ලකුණු 10)

(මුළු ලකුණු 25 යි.)

## III කොටස

- **ප්‍රශ්න අංක 04 සිට 07 දක්වා ප්‍රශ්නවලින් තෝරාගත් ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න. (එක් පිළිතුරකට වචන 150ක් වත් තිබිය යුතුය)**

(4) මිනිස් සිතේ පවතින ගුඪ සිතිවිලි පිළිබඳව පාඨකයා හමුවේ කරුණු ඉදිරිපත් කිරීමට කුස රජුගේ චරිතය යොදාගෙන ඇති ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 15)

05 සමාජ සාරධර්ම විවරණයට ස්වාභාවික පරිසරයේ සංසිද්ධීන් යොදාගෙන ඇති ආකාරය සුභාෂිතයේ නිර්දිෂ්ට කවි ඇසුරින් විමසීමට ලක් කරන්න. (ලකුණු 15)

06 තුංමංහංදිය නවකතාවේ එන සිද්ධි මනාලෙස ගළපා තිබීම නවකතාවේ සාර්ථකත්වයට ඉවහල් වී තිබේ. මේ පිළිබඳව විමසන්න. (ලකුණු 15)

07 මිනිසුන් ගේ නොමනා ක්‍රියාකාරකම් හේතුවෙන් ස්වභාවධර්මයට සිදුවන හානිය හා ඒවායේ ප්‍රතිවිපාක අපූර්වත්වයෙන් ප්‍රනිර්මාණය කිරීමට 'කාන්තාර ගමක උපත' කවි පෙළ තුළින් නන්දන වීරසිංහ කවියා සමත් වී ඇත. විමසන්න. (ලකුණු 15)

## පිළිතුරු පත්‍රය - I කොටස

01) (i) (අ) ප්‍රභාවතිය විසින් කුස රජතුමාට

(ආ) අරක්කැමිකම් කරන එක නො ගැළපෙන බවත් මගේ ම වරදින් (ප්‍රභාවතියගේ) වූ දෙයට සමාව දෙන ලෙසත් ය.

(ii) (අ) නිලධාරියා

(ආ) ඇන්තන් පවුලොවිච් චෙකොෆ්

(iii) මිනිස් හට සොඳුරු ගුණ සහ නුගුණ ඇත
නිදොස් කෙනෙකු මෙදියත උපදනේ නැත
වෙසෙස් සිනිඳු මුවරඳ බර සහස් පත
කොරොස් වලින් යුතුවෙයි කටු පෙළිනි යුත

(අ) මේ ලෝකයේ / මල් පැණිවලින්

(ආ) වැරදි නො කරන කෙනෙකු මේ ලෝකයේ උපදින්නේ නැති බව ය.

(iv) (අ) සුදොවුන් රජු විසින් බුදු රජාණන්ට

(ආ) නන්ද කුමරා මහණ කිරීම හේතුවෙනි

(v) (අ) තුංමංහංදියේ තාත්තා විසින්

(ආ) සම්බෝලයක් සෑදීම නිසා විදුහල්පති දරුවන්ට දඬුවම් කිරීම (ලකුණු 4 x 5 = 20)

(02) (i) නින්දෙන් ගත කරන, අවදිවීමට අකමැති අයෙක් උදෑසන දකින්නේ ඉතාම අසුබ දේ සිදුවන අවස්ථාවක් ලෙසට බව.

(ii) රූපක, ව්‍යංග්‍යාර්ථය, සංකේත වැනි දේ

(iii) නිසඳැස් ආකෘතිය / භාෂාව ව්‍යවහාර භාෂාව අතරින් පතර සම්භාව්‍ය භාෂා යෙදුම් භාවිතා කර තිබේ. / ව්‍යංග්‍යාර්ථවත් ය.

(iv) සාම්ප්‍රදායට වෙනස් මතයක් දැක්වීම

(v) කෙමෙන් කෙමෙන් ආලෝකය පැමිණීම / කුරුල්ලෝ බියට පත්වීම / මල් පොහොට්ටු කඳුළු සැලීම

## පිළිතුරු පත්‍රය - II කොටස

(03) (i) බුදු රජාණන් වහන්සේ දිව්‍යාංගනාවන් ලබා දීමට ඇප වූ නිසා (ලකුණු 05)

(ii) උන් වහන්සේ ගේ ප්‍රඥා බලයෙන් (දිව්‍යඥානයෙන්) (ලකුණු 05)

(iii) නන්ද විදසුන් වඩා රහත් වුවහොත් දිව්‍යාංගනාවන් පන්සියක් ලබා දෙන බවට (ලකුණු 05)

(iv) ඡේදයේ ඇති උපමා තුනක් හතරක් ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ලකුණු 10)

නැතහොත්

(i) කුඩා දරුවෙකු තම ජීවන මඟ සකස් කර ගන්නා ආකාරය හා එහි දී ඔහුට පාර පෙන්විය යුතු බවත් මුහුණ දීමට සිදුවන අභියෝග පිළිබඳවත් වැනි පිළිතුරක් (ලකුණු 05)

(ii) නිසඳැස් ආකෘතිය
වචන දෙක තුන බැගින් යොදාගෙන කෙටි විරිතක් නැත්නම් රිද්මයන් ආකාරයට ගලා යාමට සැලැස්වීම වැනි කරුණු සලකා බලන්න. (ලකුණු 05)

(iii) භාෂාව ඇතැම් තැනක සම්භාව්‍ය භාෂා යෙදුම් භාවිතය / රූපක භාවිතය / සංකේත / ව්‍යංග්‍යාර්ථය (ලකුණු 05)

(iv) කුඩා දරුවාට යාමට පාර සකස් කර දිය යුතුවේ. / එය පියවරෙන් පියවර යා යුතු බව / පාරට දොස් නො කියා එය තමා ම තේරුම් ගෙන සකස් කර ගත යුතු බව (වැනි කරුණු සාකච්ඡා කර තිබිය යුතුයි.) (ලකුණු 10)

## පිළිතුරු පත්‍රය - III කොටස

04, 05, 06, 07 යන ප්‍රශ්න සඳහා ලියා ඇති පිළිතුරුවල අදාළ බව හා ප්‍රමාණාත්මක බව සලකා නියමිත ලකුණු ලබා දෙන්න.